# සැදැහැ සිත් වඩවන බෝධිවංශය

ශ්‍රී මහා බෝධීන් වහන්සේ බෞද්ධයන්ට අති පූජනීය වස්තුවකි. ඒගැන ලියැවුණු බෝධිවංශය ද ආගමික ග්‍රන්ථයක් වෙයි. ඒ නිසා ම එය විවිධ තැන්වලදී රසිකයන්ගේ සිත සැදැහැයෙන් පුරවාලයි.

*"තව ද ඒ බුදුරජාණන් වහන්සේ උතුම් වූ ප්‍රීති ප්‍රමෝද වශයට පැමිණියාවූ සත්ත්වයන් විසින් හාත්පසින් යොදුන් සියයක් පමණ තැන් ඒක කෝලාහල කරන සේක."* (දශබල පරිනිර්වාණ කථා)
බුදුරජාණන් වහන්සේ යන යන තැන අවට යොදුන් සියයක් පමණ ප්‍රදේශයේ සිටින මිනිස්සු සාදුකාර දෙති. තම ශාස්තෘවරයා වෙනුවෙන් මෙවන් උපහාරයක් ලැබෙන්නේ යයි අසන්නට ලැබෙන එකත් බෞද්ධයෙකුට සිත් සනසා ලන කරුණකි. මෙය අසන ඔහුගේ සිත බුදු බැතියෙන් පිරීයයි.

*"විනේය ජන නැමති බන්ධූන්ට අමෘත මහා නිර්වාණ පුරයෙහි දොර හරනා සේක'"* බුදුරජාණන් වහන්සේ සත්වයන්ට නිවන් අවබෝධය පිණිස ධර්ම දේශනා කරන බව මෙසේ කීමෙන් කියමන වඩාත් රසවත් වෙයි. එපමණක් නොවේත බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ ම ඉදිරිපත් වී නිවන් පුර දොර හරිනවා යයි කීමෙන් බුදුරජාණන් වහන්සේ කොතරම් දුරට මිනිසුනට ආදරය කරන්නේ දැයි අසන්නාගේ සිත කුළ හැඟීමක් ඇති වේ. එහි පුතිඵලය වන්නේ ඔහුගේ සිත බුදු බැතියෙන් පිරී යාමයි.

*"මේ ජන්මයෙහි අධිගමයට නොපැමිණෙන්නා වූ පදපරම සත්වයන්ට ස්වර්ගලෝකයට නැගෙන්නට සද්ධර්ම නැමති හිණ දක්වන සේක."*
බුදුරජාණන් වහන්සේ කොතරම් කරුණාවන්ත දැයි බලන්න. තමන්වහන්සේගේ ධර්මය අවබෝධ කර ගත හැකි අය කෙරෙහි ආදරය කිරීම පුදුමයක් නොවේ. ඒ තම අරමුණට ඔවුන් අනුකූල වන බැවිනි. එසේ නොවන්නන් අත්හැර දැමීම බුදුරජාණන් වහන්සේගේ සිරිත නොවේ. ඔවුන්ට ද උදව්වක් උන් වහන්සේ කරති. ඒ ස්වර්ගලෝකයට යාමට උදවු කිරීමයි. ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේ ලෝකයේ සියලූ ම දෙනාට එක සේ ආදරය කළ බව නොවේ ද? මෙය අසනවිට බෞද්ධයාට උන් වහන්සේ පිළිබඳ ව බැතිබර සිතක් ඇතිවීම පුදුමයක් ද?

*"චතුස්සත්‍යාවබෝධයට නිසි වූ පුදුගලයන් දත මහාකාශ්‍යප ස්ථවිරදීන් පිණිස තුන් ගව්වක් පමණ තැන් හි ද, අංගුලිමාල ආලවකාදීන් සඳහා තිස් යොදනක් පමණ තැන්හි ද, පුක්කුසාති රාජාදීන් සඳහා පන්සාළිස් යොදනක් පමණ තැන්හි ද,... නිරන්තර ශීඝ්‍ර චාරිකා කරන සේක."*
(දශබල පරිනිර්වාණ කථා)
ලෝක සත්වයාගේ යහපත පිණිස බුදුරජාණන් වහන්සේ කොතරම් දුරට තමන් වහන්සේගේ කාලය, ශ්‍රමය කැප කළ සේක් ද? තමන් වහන්සේ ළඟට එන කෙනෙකුට පිහිට වීම අමුත්තක් නොවේ. එහෙත් අනුන්ගේ සුවය පතා ඔවුන් සොයා ගව් ගණන්, යොදුන් ගණන්, ගමින් ගමට, නගරයෙන් නගරයට පමණක් නොව රටින් රටට ද වැඩම කළ සැටි කතුවරයා දක්වන විට ඒ ගැන සිත මෙහෙයවන බෞද්ධයා තුළ අසීමිත භක්තියක් ඇති නොවන්නේ ද?

දුටුගැමුණු රජු රුවන්මැලි මහ සෑයෙහි ධාතු නිධාන කරන දවසේ බුදුරජාණන් වහන්සේ නොව උන්වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේ දැක්වූ ප්‍රාතිහාර්යයන් ගැන කතුවරයා දිග වර්ණනයක් මහා විහාර ප්‍රතිග්‍රහණ කථාවෙහි කරයි. ධාතූන් වහන්සේ අහසට පැන නැග යමා මහ පෙළහර දැක්වූ සැටි, සවනක් බුදුරැස් පතුරුවා ලෝකය ආලෝකවත් කළ සැටි, නැවත බද්ධ වේෂය හැර ධාතු කරඬුව තුළට පිවිසි සැටි, අසනවිට සැදැහැවතුන්ගේ සිත තුළ බුද්ධාලම්බන ප්‍රීතිය දෙගුණ තෙගුණ වෙමින් නැග එයි. ඉන් පසු රජුගේ අධිෂ්ඨානය පරිදි නැවත ධාතූන් වහන්සේ බුද්ධවේශය ගෙන , සුගත චීවරය හැඳ, පටිධාතුව බැඳ, බුදුරදුන්ගේ සිරුර සේ ම බබළමින්, පිරිනිවන් මංචකයෙහි සැතපුණු ආකාරය අසන කියවන කෙනෙකු තුළ බුදුරදුන්ගේ ධාතූන් වහන්සේ මෙතරම් සමත් නම් ජීවමාන බුදුරජාණන් වහන්සේ කොතරම් ආනුභාව ඇති කෙනෙකු දැයි මහත් භක්තියෙන් සිතයි. මේ හැම තැනකදී ම කතුවරයා ඉතා සුළු සිද්ධීන් පවා විස්තර කරන්නේ එක් එක් සිද්ධිය වෙන වෙන ම ශ්‍රාවකයාගේ සිතෙහි ඇඳ තැබීමටයි. ඒ මගින් ඒ ඒ පියවරක් පාසා සැදැහැවතාගේ සිතේ බුදු සිරුර අඳියි.  ඇඳෙන ඇඳෙන රුවක් රුවක් පාසා ඔහුගේ සිත බුදු බැතියෙන් පිනා යයි.

තවත් මෙවෙනි කරුණු ධාත්වාගමන කථාවෙන් හමු වෙයි. එහි සඳහන් පරිදි ධාතූන් වහන්සේ වැඩමවන අවස්ථාවේ රජු සිතූ ආකාරයෙන් ම කිසිවෙකුගේ මෙහෙයවීමක් නැතිව ඇතු පිට තිබූ ධවලච්ඡත්‍රය පසෙකට ඇල වී,. මඟුලැතු බිම දණගසා ධාතූන් වහන්සේ ඇතු පිට තබන විට ම ඇතා කුඤ්චනාද කළේ ය. පොකුරු


ඉස්කෝලේ edulanka.lk

වැසි වැටුනේ ය, මහපොළොව කම්පා විය. කිසිවෙකුගේ මෙහෙයවීමක් නැතිව ම ඇ ා ථූපාරාමය පිහිටන තැනට ගියේ ය. එහෙත් ධාතූන් වහන්සේ බිමට බාන්නට ඉඩ දුන්නේ නැත. මේ සියල්ල ධාතූන් වහන්සේගේ ආනුභාවයෙනි. දාගැබෙහි ධාතූන් වහන්සේ තැන්පත් කරන අවස්ථාවේ ද ධාතූන් වහන්සේ ප්‍රාතිහාර්ය පෑසේක. මේ අසිරිමත් දේ ගැන සිහි කරන විට සැදැහැවතෙකුගේ සිත බුදු බැතියෙන් පිනා යාම ගැන කවර නම් කථා ද?

දුමින්දාගමන කථාවෙහි බුදුරදුන්ගේ අධිෂ්ඨාන පහක් ගැන කියවෙයි.

i. ධර්මාශෝක රජු බෝධි ශාඛාවක් ගන්නට ගිය කල බෝධි ශාඛාව කිසිවෙකුගේ මෙහෙයවීමක් නැතිව ම රන් කටාහයෙහි පිහිටිය යුතු ය.
ii. ඒ ශාඛාවේ කොළ හා ගෙඩිවලින් පමණක් රැස් විහිදිය යුතු ය.
iii. බෝධිශාඛාව වළා ගැබට වැදී සතියක් සිටිය යුතු ය.
iv. ථූපාරාමයේ ධාතු තැන්පත් කරන දින ධාතූන් වහන්සේ අහසට පැන නැගී යමා මහ පෙළහර දැක්විය යුතු ය.
v. රුවන්මැලි සෑයෙහි ධාතු තැන්පත් කරන දිනයේ ධාතූන් වහන්සේ බුදු සිරුර මවා යමා යහ පෙළහර දැක්විය යුතු ය.

මේ අධිෂ්ඨානයන් එසේ ම සිදු වන බව ද කතුවරයා විස්තර කරයි.

ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවද්දී ද දඹදිවදි දැක්වූ අසිරිවත් පෙළහර, මෙහි වැඩමවද්දී මුහුදේ රළ සන්සුන් වීම, නෙළුම් මල් පිපීම, දෙවියන් විවිධ පූජෝපහාර පැවැත්වීම, නාගයන් මැවූ අන්ධකාරය සංඝමිත්‍රාවන් විසින් දුරු කරනු ලැබීම, නාගයින් සංඝමිත්‍රාවන්ගෙන් බෝධීන් වහන්සේ ඉල්ලාගෙන ගොස් සතියක් පුද පූජා පැවැත්වීම ආදි අසිරිමත් දේ ද බෝධිවංශයෙහි විස්තර වෙයි.

මෙසේ සිංහල බෝධිවංශ කතුවරයා මේ අසිරිමත් දේ මෙසේ උසස් අයුරින් විස්තර කරන්නේ ඇයි? බෝධිවංශය රචනා කරන්නේ සැදැහැවතුන්ගේ සැදැහැ වඩවා ලීමට වන බැවිනි. බෝධිවංශය ආගමික ග්‍රන්ථයක් වුව ද අභිධර්ම ග්‍රන්ථයක් නොවේ. ගැඹුරු බණ විස්තර කිරීමක් කතුවරයාගේ අරමුණට සම්බන්ධ නොවේ. ඔහු අපේක්ෂා කරන්නේ සාමාන්‍ය ජනතාව බොදු බැතියෙන් පිනවා මහා විහාර පරපුරේ අනුගාමික සංඛ්‍යාව වැඩි කර ගැනීමටයි.

සාමාන්‍ය ජීවිතයේදි අප අත් දකින්නේ නැති, සාමාන්‍ය කෙනෙකු විසින් කළ නොහැකි අසිරිමත් පෙළහර විස්තර කිරීම මගින් ඔහු බලාපොරොත්තු වන්නේ සාමාන්‍ය ශ්‍රාවකයා විශ්මයට පත් කරවීමෙන් ඔහු තුළ වැඩි බැතිබර බවක් ඇතිකර ගත හැකියි.


ඉස්කෝලේ edulanka.lk